MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - rehearsal Paper

අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

HISTORY

ඉතිහාසය

# QUESTION PAPER - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**ඉතිහාසය II**

**අ.පො.ස. (සා/ පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය - පැය 3 යි**

සැළකිය යුතුයි.

- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.

1) පහත (I) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේ ද, (II) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ ද නිවැරදිව ලකුණු කොට නම් කරන්න.

**ආ)** (I) ඌරාතොට, යාන්ඔය, නාච්චාදූව වැව, මහියංගනය, දීඝවාපිය, බුන්දල, කදුරුගොඩ, කච්චරගාම, ඇළහැර අමුණ, කොළඹ, යෝධ වැව, සීගිරිය

(II) කළු මුහුද, මක්කම, පිලිපීන දූපත්, නයිල් ගඟ, සුවස් ඇළ, හිරෝෂිමා

(ලකුණු 18)

**ආ)** (I) පහත A, B, C, D යටතේ දක්වා ඇති තොරතුරුවලට සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි අනුපිළිවෙලින් නිවැරදිව ලියන්න.

A - කුණාටුවකට හසුව අහඹු ලෙස ශ්‍රී ලංකාවට ගොඩබට පෘතුගීසි ජාතිකයා වන්නේ,


B - බෙලිගල නම් ස්ථානයේ දළදා මාළිගාවක් නිර්මාණය කර දළදා වහන්සේ තැන්පත් කළ රජු වන්නේ,

C - එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්මාණය කිරීම සඳහා මුල් වූ රුසියානු නායකයා වන්නේ,

D - 1795 දී ලන්දේසින් සතුව පැවති ත්‍රිකුණාමල වරාය අල්ලා ගැනීමෙන් පසු රාජාධි රාජසිංහ රජු හමු වූ ඉංග්‍රීසි ජාතිකයා වූයේ,

(ලකුණු 04)

(II) A හා B යටතේ දක්වා ඇති රූප සටහන්වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A - (i) මෙම ප්‍රතිමාව කුමන රජුගේ ද?

(ii) මෙම ප්‍රතිමාව දැකිය හැක්කේ කුමන ස්ථානයේ ද?

(iii) මෙතුමාගේ කාලයේ තානාපති සම්බන්ධතා පැවැත්වූ රට කුමක් ද?

(iv) එම රටින් මෙරටට රැගෙන එන ලද වටිනා ද්‍රව්‍ය කුමක් ද?

(ලකුණු 04)



B - (i) මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා කවුද?

(ii) මොහු විසින් රචනා කරන ලද වැදගත් ග්‍රන්ථය කුමක් ද?

(iii) මොහු විසින් රටේ බලය බෙදිය යුතු යැයි ප්‍රකාශ කළ ප්‍රධාන අංශ තුන නම් කරන්න.

(iv) මොහුගේ රට කුමක් ද? (ලකුණු 04)

2) i. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පහතරට තෙත් කලාපීය ලෙන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. ප්‍රාග් ඓතිහාසික මානවයා භාවිතා කළ අභිචාර විධි ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. a) පූර්ව ඓතිහාසික යුගය, ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් වී පෙනෙන සාධක තුනක් ද,

b) මුල් ඓතිහාසික යුගයේ බිහි වූ වාපි ගම් දෙකක් ද නම් කරන්න. (ලකුණු 05)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

3) i. රජවරුන්ගේ ක්‍රියා කලාපය අනුව පහත රාජ්‍යත්ව සංකල්ප ආරෝපණය වූ රජවරු වරහන් තුළින් තෝරා ලියන්න.

A - දේවත්ව

B - පර්වතරාජ

C - චක්‍රවර්ති

( IV වන කාශ්‍යප, නිශ්ශංකමල්ල, කූටකණ්ණ අභය, I වන කාශ්‍යප, බුද්ධදාස) (ලකුණු 03)

ii. පහත සඳහන් එක් එක් කරුණු හා සම්බන්ධ පුද්ගලයන් නම් කරන්න.

A - ප්‍රාදේශීය පාලකයන් කිහිප දෙනෙකු හා සටන් කොට අනුරාධපුර රාජධානිය ගොඩනගා රජ බවට පත් වීම.

B - ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවයට කතරගම හා චන්දනගම ක්ෂත්‍රියන්ට ආරාධනා කළ රජු

C - රට ආස්ථානවලට බෙදා ඒවා පාලනයට වෙනම ඇමතිවරු පත් කළ රජු

D - පරුමකවරුන් ලෙස කටයුතු කළ අයට මධ්‍ය පාලනයේ සේනාපති තනතුරු පිරිනැමීම. (ලකුණු 04)

iii. පොදු සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීම සඳහා පැරණි පාලකයන් කටයුතු කළ ආකාරය උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. I වන විජයබාහු රජතුමාගේ ශ්‍රේෂ්ඨත්වය කරුණු දෙකකින් විස්තර කරන්න. (ලකුණු 06)

4) i. ජලය රැගෙන යාම සඳහා පැරැන්නන් විසින් ඉදිකළ ප්‍රධාන ඇළ මාර්ග තුනක් නම් කරන්න.

(ලකුණු 03)

ii. ජල කළමණාකරණයේ උසස්ම නිර්මාණය වන්නේ වැව යි. පහත A, B, C, D වලින් දක්වා ඇත්තේ වැවක ප්‍රධාන කොටස් කිහිපයකි. ඒවායින් කෙරෙන කාර්යයන් මොනවාදැයි ලියන්න.

A - සොරොව්ව B - රළපනාව

C - වැව් බැම්ම D - පිටවාන (ලකුණු 04)

iii. අතීත ලංකාවේ අපේ මුතුන් මිත්තන් සතුව පැවති මැනීම හා ගණනය පිළිබඳ දේශීය දැනුම කරුණු දෙකකින් පැහැදිළි කරන්න. (ලකුණු 05)

iv. විද්‍යාව හා තාක්ෂණය භාවිතා කොට පැරැන්නන් උසස් වාස්තු විද්‍යාත්මක නිර්මාණ සිදු කර ඇති බව උදාහරණ තුනක් යොදාගෙන පෙන්වා දෙන්න. (ලකුණු 06)

5) i. පහත සඳහන් රජවරු පාලනයට පත් වූ රාජධානිය වරහන් තුළින් තෝරා A,B,C අනුපිළිවෙළින් ලියන්න.

A - II පරාක්‍රමබාහු රජු

B - IV පරාක්‍රමබාහු රජු

C - VI පරාක්‍රමබාහු රජු

( කුරුණෑගල, දඹදෙණිය, කෝට්ටේ) (ලකුණු 03)

ii. දෙවන නාගරීකරණයට අයත් රාජධානි හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii. 13 - 15 සියවස් අතර කාලයේ මෙරට රාජධානි ගොඩනැගීමේ දී කැපී පෙනුණු ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. කෝට්ටේ රාජධානියේ පරිහානියට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

6) i. පහත නම් සඳහන් පුද්ගලයන් රාජ්‍යත්වයට පත් වූයේ කුමන නමකින්දැයි වරහන් තුළින් තෝරා ලියන්න.

A - කන්නසාමි

B - මහා අස්ථාන

C - කොනප්පු බණ්ඩාර

( II වන රාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ, I වන විමලධර්මසූරිය) (ලකුණු 03)

ii. පෘතුගීසීන් උඩරට ආක්‍රමණය කළ පහත සටන් සඳහා නායකත්වය ගත් මෙරට රජවරු දෙදෙනා ලියන්න.

A - ගන්නෝරු සටන

B - බලන සටන (ලකුණු 04)

iii. මහනුවර රාජධානියේ පැවති ආර්ථික ලක්ෂණ දෙකක් නිදසුන් සහිතව පැහැදිළි කරන්න. (ලකුණු 05)

iv. මහනුවර රාජධානිය පෘතුගීසි හා ලන්දේසීන්ට යටත් කර ගැනීමට නොහැකි වූ හේතු තුනක් කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 06)

7) i. ප්‍රංශ ජාතීන් ඉන්දියාවේ පිහිට වූ වෙළඳ මධ්‍යස්ථාන පමණක් වරහන් තුළින් තෝරා ලියන්න.

( සුරාත්, කරිකාල්, පොන්ඩිචෙරි, බොම්බාය, චන්ද්‍රනගර්, කල්කටා ) (ලකුණු 03)

ii. ක්‍රි.ව. 1815 දෙවන උඩරට ආක්‍රමණය සාර්ථක වීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iii. වතු වගාවේ දියුණුව සඳහා බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

iv. නිදහසින් පසු මෙරට ආර්ථිකයේ කැපී පෙනුන ලක්ෂණ තුනක් නිදසුන් සහිතව පැහැදිළි කරන්න.

(ලකුණු 06)

## III කොටස

8) i. යුරෝපයේ කාර්මික විප්ලවය තුළ පහත නිර්මාණ කළ පුද්ගලයන් වරහන් තුළින් තෝරා ලියන්න.

A - දුවන නඩාව

B - දුම් බෝට්ටුව

C - වාෂ්ප දුම්රිය

( රොබට් පුල්ටන්, ජෝර්ජ් ස්ටීවන්සන්, ජෝන් කේ. ) (ලකුණු 03)

ii. කාර්මික විප්ලවය අන් රටවල පැතිරීමට තිබූ බාධා දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. කාර්මික විප්ලවයේ බලපෑම මෙරට ආර්ථිකය තුළ ඇතිකළ වෙනස්කම් කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

iv. කාර්මික විප්ලවයේ අහිතකර බලපෑම් ලෝකය තුළ ගැටළු රැසක් නිර්මාණය කර ඇත. මෙය කරුණු තුනක් යටතේ විස්තර කරන්න. (ලකුණු 06)

9) i. පළමු ලෝක යුද්ධයේ දී මිත්‍ර පිළ නියෝජනය කළ ප්‍රධාන රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. පළමු ලෝක යුද්ධයෙන් පසු ලෝක සාමය උදෙසා බිහි වූ ජාතීන් සංගමයේ අරමුණු දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iii. දෙවන ලෝක යුද්ධයේ දී ජර්මනියේ හා ජපානයේ ක්‍රියා කලාපය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)